**තාක්ෂණ පීඨය, වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය**

# ඉදිකිරීම් සේවක ඵලදායිතාව හා කාර්ය සාධන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව (DCLPPM) – 2025/26

2025 ජනවාරි/පෙබරවාරි මස ආරම්භ වීමට නියමිත ඉහත ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ඉදිකිරීම් සේවක ඵලදායිතාව හා කාර්ය සාධන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, ඉදිකිරීම් ස්ථානවල සේවක මෙහෙයුම් පිළිබඳ අධීක්ෂණ පිළිවෙත් ඍජුවම ක්‍රියාත්මක කරන ඉදිකිරීම් අධීක්ෂකවරුන්/තාක්ෂණික නිලධාරීන් සඳහා විශේෂයෙන්ම නිර්මාණය කර ඇති පුළුල් පාඨමාලාවකි. මෙම ඩිප්ලෝමා වැඩසටහනේ විෂය මාලාව ඉදිකිරීම්වලදී සේවක කාර්යසාධනය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ ඍජු විෂය පථය සමඟ සංක්ෂිප්තව සංවර්ධනය කරන ලදී .සේවක කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා කර්මාන්තයට අවශ්‍ය නිපුණතා, දැනුම සහ ආකල්ප මෙම වැඩසටහන මගින් පැහැදිලිව දක්වා ඇති අතර, ක්‍රියාකාරී අධ්‍යාපනය සහ පුහුණු උපාය මාර්ග තුළින් කර්මාන්තයේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ඵලදායී හා නව්‍යකරණ භාවිතයන් ඇතුළත් වේ.

<u>ඇතුළත් වීමේ සුදුසුකම්</u>

අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය සමත් වීම හෝ ඒ හා සමාන සුදුසුකමක් භෞතික විද්‍යාව/ඉංජිනේරු තාක්ෂණය/ජෛව පද්ධති තාක්ෂණය/ජීව විද්‍යාව/වාණිජ්‍යය/කලා විෂය ධාරාව යන අංශවලින් ලබා තිබීම

**හෝ**

අවම වසර 12 ක පාසල් කාලයක් නිමා කිරීමෙන් පසු යෝග්‍යතා පරීක්ෂණවලට මුහුණ දී **SLQF** දෙවන අදියරට සමාන මූලික පාඨමාලාවක් සමත් වීම

**හෝ**

**NVQF** සිව්වන අදියරට සමාන පාඨමාලාවක් සමත් වීම හෝ සංජනන පාලම් වැඩසටහන් පිළිබඳ පිළිගත් පෙර අධ්‍යාපනයක් ලබා තිබීම හෝ පිළිගත් රැකියා අත්දැකීමක් ලබා තිබීම

**හෝ**

ඉහත සඳහන් නොකළ සුදුසුකමක්, නමුත් එය සලකා බැලීම සඳහා **DCLPPM** අධ්‍යයන මණ්ඩලයේ හා වයඹ විශ්වවිද්‍යාලයේ සනාථන සභාවේ අනුමැතිය හිමි විය යුතුය.

**සහ**

අ.පො.ස. (සා. පෙ.) විභාගයේදී ගණිතය සහ ඉංග්‍රීසි විෂයන් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (**S**) සාමාර්ථයක් ලබා තිබීම

**සහ**

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවම වසරක රැකියා / පුහුණු අත්දැකීමක් ලබා තිබීම

- **<u>ඉලක්කගත පිරිස</u> :** ඉදිකිරීම් අධීක්ෂකවරුන්/ තාක්ෂණික නිලධාරීන් / කර්මාන්ත වෘත්තිකයින්
- **<u>කාල සීමාව</u> :** වසර 1 (අර්ධ කාලීන)
- **<u>මාධ්‍ය</u> :** ඉංග්‍රීසි (සිංහල/දෙමළ අවශ්‍ය වූ විටදි භාවිතා කෙරේ.)
- **<u>සුදුසුකම් මට්ටම</u> :** SLQF Level 3 (NVQ Level 5 ට සමාන වේ)
- **<u>පාඨමාලා ගාස්තුව</u> :** රු. **90,000.00**

[සම්පූර්ණ පාඨමාලා ගාස්තුව වාරික දෙකකින් ගෙවිය හැක. පළමු වාරිකය (රු. 60,000) පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේදී ගෙවිය යුතු අතර දෙවන වාරිකය (රු. 30,000) පාඨමාලාව ආරම්භ කර මාස තුනක් (03) ඇතුළත ගෙවිය යුතුය.]

- **<u>ස්ථානය</u>:** කුලියාපිටිය පරිශ්‍රය**,** වයඹ විශ්වවිද්‍යාලය **(පාඨමාලාවේ ඇතැම් කොටස් මාර්ගගත ක්‍රමයට (online) ඉගැන්වීම සිදුකෙරේ.)**




**අයදුම් කිරීමේ අවසාන දිනය : 20.01.2025**

- අයදුම් පත්‍ර විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (**<u>www.wyb.ac.lk/dclppm/</u>**) බාගත කල හැක. අයදුම්පත්‍ර විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කිරීමේදී **රු.500.00 ක මුදලක් ශ්‍රී ලංකා** විශ්වවිද්‍යාලයේ **ගිණුම් අංක: 88154489** ට **(Current Account – Wayamba University of Sri Lanka)** බැරකල යුතුය. ඕනෑම ලංකා බැංකුවකින් ගෙවීම් කල හැකි අතර බැංකු රිසිට් පතක් නොමැතිව අයදුම් පත්‍ර පිළිගනු නොලැබේ.

- සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍ර අදාළ ලියකියවිලි සමග ලියාපදිංචි තැපැලෙන් **අධ්‍යක්ෂක, ඉදිකිරීම් සේවක ඵලදායිතාව හා කාර්ය සාධන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, තාක්ෂණ පීඨය, වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය** යන ලිපිනයට එවිය යුතුය.

**වැඩිදුර විස්තර සඳහා විශ්ව විද්‍යාල වෙබ් අඩවිය (<u>www.wyb.ac.lk/dclppm/</u>) භාවිතා කරන්න.**
**සම්බන්ධ වීමට (E-mail: <u>dclppm@wyb.ac.lk</u> ; T.P: 0718154002 / 0761254992 / 0718269483 / 0763335182).**